# හම්බන්තොට ප්‍රාදේශිය සභාව

# හම්බන්තොට දිස්ත්‍රික්කය.

## 01. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 13 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 24 දිනද , විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය පකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණ අතර මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) 2010 ජනවාරි මාසයට අදාල රු. 599,518 ක් වූ වරෙන්තු ගාස්තු හා දඩ මුදල් දෙවරක් අදාල ගිණුමට බැර කිරීම නිසා වරෙන්තු ගාස්තු හා දඩ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මුද්දර ගාස්තු හා උසාවි දඩ ලේඛනය අනුව 2010 ජනවාරි 01 දිනට රු. 4,162,638 ක මුදලක් අයවිය යුතුව තිබුණද , වරෙන්තු ගාස්තු හා දඩ ගිණුමේ එදිනට ශේෂය වශයෙන් පෙන්වා තිබුණේ රු. 4,000,000 කි. සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල් වූ රු. 3,362,326 ක මුදලින් රු. 599,518 ක් හා ඉකුත් වර්ෂයට අදාල සම්පූර්ණ මුදලද 2010 වර්ෂයේදී ලැබී තිබුණි. ඒ අනුව

වරෙන්තු ගාස්තු හා උසාවි දඩ ගිණුමේ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 2,762,808 ක් වියයුතු වුවද , එදිනට ශේෂය රු. 3,199,688 ක් ලෙස රු. 436,880 කින් වැඩිපුර පෙන්වා තිබණි.

(ඇ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2011 අප්‍රේල් 08 දිනැති මුද්දර ගාස්තු දැනුම්දීමේ ලිපිය අනුව 2010 වර්ෂය සඳහා මුද්දර ගාස්තු රු. 1,624,950 ක මුදලක් දක්වා තිබුණද , 2010 ජනවාරි 01 දිනට හිඟහිටි වෙනත් ආදායම් (මුද්දර ගාස්තු) ගිණුමේ ආරම්භක ශේෂය රු. 2,589,597 ක් විය. එකී මුදලින් රු. 1,454,097 ක මුදලක් 2010 අගෝස්තු මාසයේදී අයවී තිබුණි. ඒ අනුව මෙම ගිණුමේ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 2,760,450 ක් වියයුතුව තිබුණද, එදිනට ශේෂය රු. 2,531,200 ක් ලෙස රු. 229,250 ක මුදලක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඈ) මහාමාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ මහ නැගුම සංවර්ධන වැඩසටහන යටතේ 2009 වර්ෂයට අදාලව මාර්ග සංවර්ධනයට 2010 වර්ෂයේදී ලැබුණු රු. 2,541,202 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ වැඩසටහන් අංක 03 යටතේ ප්‍රාග්ධන ආධාර ලෙස දක්වා ඇති රු. 14,937,343 ක මුදල තුළ ඇතුලත් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශනවල ගිණුම් වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන දක්වා නොතිබුණි.

(ඊ) ප්‍රධාන ලෙජරයේ ගිණුම්වලට කරන ලද සටහන් ප්‍රා.ස. 13 හා 14 අනුව නිවැරද වුවද , වැය ලේඛනය හා සැසඳීමේදී මාස 08 ක , ලෙජර් ගිණුම අනුව කරන ලද සටහන් කිරීම්වල වෙනස්කම් නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් වත්කම් හා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලිවල අගය වූ රු. 2,028,655 ක් හා සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී ඇති පුස්තකාල ජංගම බස් රථයේ වටිනාකමද , ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2010 දෙසැම්බර් මාසය සඳහා බැංකු ගිණුම් 03 ක් සඳහා පිළියෙල කරන ලද බැංකු සැසඳුම් වාර්තා අනුව අයකරන ලද බැංකු ගාස්තු හා චෙක්පොත් ගාස්තු රු. 42,772 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ගලපා නොතිබුණි.

(එ) ලංකා බැංකුවේ සේවක ණය සම්බන්ධයෙන් අංක 0002163905 ජංගම ගිණුමේ 2010 දෙසැම්බර් මාසයට අදාල බැංකු සැසඳුම් වාර්තාව අනුව 2010 දෙසැම්බර් 31 දිනට මුදල්පොත් අනුව ශේෂය රු. 49,306 ක් වුවද , ශේෂ පත්‍රයේ එදිනට ශේෂය රු. 56,186 ක් ලෙස රු. 6,880 ක වැඩිපුර පෙන්වා තිබුණි.

1.3.3 <u>නොසැසඳු පාලන ගිණුම්.</u>

ප්‍රධාන ලෙජරයට අනුව 2010 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 9 කට අදාල පාලන ගිණුම් හා උපයෝගී ලේඛන / උපලේඛනවල එකතු ශේෂයන් අතර රු. 4,012,610 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 6,511,620 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 සිට අවුරුදු 03 දක්වා වු විගණන විමසුම් 22 කට පිළිතරු ඉදිරිපත් කර නොතිබුණු අතර එකී විමසුම් වලට භාජනය වු ගණනය කල හැකි ගණුදෙනු වල වටිනාකම රු. 1,858,600 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 26,877,361 ක්වු ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) <u>ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

2010 වර්ෂයට අදාල වටිනාකම රු. 55,247 ක් වූ ගෙවීම් වවුචර් 05 ක් විගණනයට ඉදිරිපත් නොකෙරිණ.

1.3.6 <u>අනුකූල නොවීම්.</u>

පහත දැක්වෙන නීති, රීති , රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා <u>(මුල්‍ය හා පරිපාලන) රීති මාලාව.</u> | |
| (i) රීති 101 | වැය කිරීම් වලට බලය දුන් සභාවේ යෝජනා සම්මුතිය |

ඇතැම් වවුචර් වල දක්වා නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ii) | රීති | 105 | ගෙවීම් ලේඛනවල සටහන් මකා දැමීම් වලදී කෙටි අත්සන් යෙදීමෙන් වෙනස් කිරීම් සහතික කර නොතිබුණි. |
| (iii) | රීති | 125 | වැය ලේඛනය විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණි. |
| (iv) | රීති | 150 | පි.එස්. 5 ආකෘතිපත්‍රය ප්‍රකාර සාරාංශ මුදල් පොතක් පවත්වා නොතිබුණි. |
| (v) | රීති | 155 | ප්‍රධාන මුදල් පොතේ (පි.එස්. 10) දෛනික ශේෂය දැක්වෙන පරිදි එකී ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (vi) | රීති | 164 | ගිණුම් හා ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කොට නිවැරදි බවට සහතික කර නොතිබුණි. |
| (vii) | රීති | 193 | අයවැයගත ආදායම් හා වියදම් , තථ්‍ය ආදායම් හා වියදම් අතර සසදා බලා විචලනයන් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි. |
| (viii) | රීති | 218 | සභාවට අයත් හා සභාව ප්‍රයෝජනයට ගන්නා සියළු , ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි. |

(ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.</u>

| | | | |
|---|---|---|---|
| (i) | මු.රෙ. | 387 | සභා අරමුදල් ගිණුමෙන් 2010 දෙසැම්බර් 31 දිනට රු. 432,471 ක අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. |
| (ii) | මු.රෙ. | 189 | රු. 1,216 ක් වූ අගරු චෙක්පත් සම්බන්ධයෙන් යොමු ගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. | 396 (ඇ) | රු. 39,023 ක කල් ඉකුත් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් යොමු ගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

02. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 3,697,405 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 2,675,457 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 30 | 27 | 255 | 30 | 25 | 232 |
| බදුකුළී | 2,491 | 135 | 74 | 2,451 | 238 | 10 |
| බලපත්‍ර ගාස්තු | 417 | 607 | 685 | 417 | 476 | 643 |
| වෙනත් ආදායම් | 22,157 | 13,284 | 13,951 | 16,654 | 13,345 | 16,672 |

2.2.2 වරිපනම් බදු අයකිරීම.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 1988 වර්ෂයේ තක්සේරු වටිනාකම මත වරිපනම් බදු අයකර තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.178,190 කි.

(ඇ) වරිපනම් බදු ගෙවන්නන් 548 දෙනෙකුගෙන් වසර 10 ඉක්මවා බදු නොගෙවා තිබූ බදුකරුවන් ගණන 498 කි.

2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 3,199,688 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 <u>මුද්දර ගාස්තු.</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් රු. 2,531,200 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.5 හිඟ වෙළඳ බලපත්‍ර ගාසතු.

2010 දෙසැම්බර් 31 දිනට වෙළඳ ව්‍යාපාර 65 කින් රු.141,200 ක මුදලක් හිඟව තිබූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තියේ විධිවිධාන අනුව හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.6 කඩ කාමර කුලී .

බැල්ලගස්වැව කඩ කාමර 12 ක් සඳහා රු. 59,400 ක්ද , සිරිබෝපුර බෝගහ හන්දිය කඩ කාමර 02 ක් සඳහා රු. 14,425 ක්ද වශයෙන් රු. 73,825 ක් 2010 දෙසැම්බර් 31 දිනට හිඟව තිබුණ අතර බැල්ලගස්වැව කඩ කාමර සඳහා විධිමත් තක්සේරුවක් අනුව කුලිය අයකර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 10,384 | 8,454 | 1,930 | 9,343 | 7,950 | 1,393 |
| අනෙකුත් | 9,982 | 9,296 | 686 | 7,158 | 8,792 | (1,634) |
| උප එකතුව | 20,366 | 17,750 | 2,616 | 16,501 | 16,742 | (241) |
| ප්‍රාග්ධන වියදම් | 17,730 | 16,762 | 968 | 14,155 | 20,309 | (6,154) |
| මුළු එකතුව | 38,096 | 34,512 | 3,584 | 30,656 | 37,051 | (6,395) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතික | 06 | 10 |
| ප්‍රාථමික | 13 | 14 |
| වෙනත් (අනියම්/තාවකාලික /ආදේශක) | - | 14 |

2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 ප්‍රකාරව විධිමත් අනුමැතියක් ලබානොගෙන, සභාව විසින් සේවකයින් 14 දෙනෙකු (ආදේශක) බඳවාගෙන සේවයේ යොදවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.14,964,400 ක් වු අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන්හි එකතුව රු. 558,840 ක් විය.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,869,517 ක් වු අතර, අවුරුදු 1 ක කාලයක් ඉක්මවා අයවීමට හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 27,650 ක් විය.

### 2.5.3 නිෂ්ක්‍රීය වත්කම්.

පහත දැක්වෙන වත්කම් නිෂ්ක්‍රීයව පවැතින.

(අ) රු. 500,000 ක අගයකට වූ 12.5 කේ.වී. ඩීසල් ජෙනරේටය

(ආ) භාවිතා කල නොහැකි තත්ත්වයේ පවතින ජල බවුසරය.

(ඇ) රු. 200,000 ක අගයකට වූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය

2.5.4 ඉන්වෙන්ට්‍රිලේඛන පවත්වා නොතිබීම.

සිසිලසගම මහජන පුස්තකාලයට හා බෝසත් පදනමට ලබාදෙන ලද ස්ථාවර වත්කම් විෂයයන් 11 ට අදාලව ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(අ) අරමුදල් ඌණ උපයෝජනය.

2010 වර්ෂයට අදාල පෙර පාසල් උපකරණ මිලට ගැනීම සදහා පුද්ගලික සමාගමක් විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානය කර තිබූ රු. 200,000 ක මුදලක් එකී උපකරණ මිලට ගැනීමට යොදවා නොතිබුණි.

(ආ) බැහැර දුන් පොත් ආපසු භාරනොදීම.

සිසිලසගම මහජන පුස්තකාලයේ ආපසු භාර නොදුන් පුස්තකාල පොත් වල අගය වූ රු. 2,232 ක් පොත් ලබාගත් අයගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වාහන පාලනය.

252-6542 දරණ ඩබල් කැබ් රථයට අදාල දෛනික ධාවන සටහන් වල 2008 වසරේ සිට 2010 සැප්තැම්බර් 07 දින දක්වා ඉන්ධන පරිභෝජනය පිළිබඳව හා මයිලෝමීටරයේ දත්ත සටහන් කර නොතිබුණ බවද , සභාවට අයත් වාහන 08 ට අදාල ලොග් සටහන් පොත් අක්‍රමවත්ව පවත්වාගෙන ගොස් තිබුණ බවද, නිරීක්ෂණය විය.

(ඈ) වීථි පහන් නඩත්තු කිරීම.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2010 මැයි සිට සැප්තැම්බර් දක්වා වීථි පහන් නිකුත් කිරීම් ගබඩා ලෙජරයේ සටහන් කර නොතිබුණි.

(ii) 2010 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා වීථි පහන් 1161 ක් විදුලි කාර්මික විසින් අළුතින් සවිකර තිබුණද , එකී සවිකිරීම් වගකිව යුතු නිලධාරියෙකු විසින් අධීක්ෂණය කළ බවට සහතික කර නොතිබුණි.

(iii) වීථි පහන් සවිකළ කණු අංක විදුලි කාර්මික පවත්වා ගන්නා ලද වාර්තාවල සටහන් කර නොතිබුණි.

(iv) වීථි පහන් අළුත්වැඩියා කිරීම සඳහා කරන ලද ඉල්ලීම් හා ඒ සඳහා දෙන ලද අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරිනි.

(v) 2010 සැප්තැම්බර් 08 දින ගබඩාවේ කරන ලද භෞතික පරීක්ෂාවේදී වීථි පහන් 98 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

(vi) ස්වේච්ඡා සංවිධානයක් මගින් 2010 ජුලි මාසයේදී දින ලබාදෙන ලද සෝලාර්පවර් වීථි ලාම්පු 46 කින් 13 ක් 2010 සැප්තැම්බර් 30 දිනට නිකුත් කර තිබුණද, එකී ලැබීම් හා නිකුත් කිරීම් ගබඩා ලෙජරයේ සටහන් කර නොතිබුණි.

## 03. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය